# ස.ණ.ස. පුවත් කොළඹින්

2018 - දෙසැම්බර් - දොළොස්වන කලාපය    දායකත්වය රු 15/-








සරත් අතුකෝරල




කේ.ඒ. පියතිලක

# වංචනික ක්‍රියා පරීක්ෂා කරනු වෙනුවට ලක්ෂ 100 ක අරමුදලින් ලාභ ණයක්

සණස නායක සමුපකාර ප්‍රසාදිනී ඩැනිසන් වීරසූරිය.

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොළඹ කොට්ඨාශයේ නිලධාරීන්ගේ ස.ණ.ස. සමිතියේ අක්‍රමිකතාවන් පිළිබඳව පරීක්ෂා කරනු වෙනුවට රෙපිස්ට්‍රාර්වරයා කර ඇත්තේ පෙර දී තිබූ දස ලක්ෂයක ණය වෙනුවට ලක්ෂ සියයක්ම ණය ලෙස සමුපකාර අරමුදලින් ලබා දීමයි. මෙම සමිතියේ 2014.03.31 න් අවසන් වර්ෂයේ විගණනයෙන් හෙළිකර ඇති වංචනික ක්‍රියාව සම්බන්ධයෙන් ප්‍රඥප්තියේ 47(2) යටතේ පරීක්ෂණයක් පවත්වන ලෙස ඉල්ලා සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා වෙත 2018.10.31 දිනෙන් කොළඹ දිසා සංගමයේ ගරු සභාපතිතුමා යවා ඇති ලිපියේ මෙසේ සදහන් වෙයි.

2013.03.01 දින අංක 147546 දරණ චෙක්පත මගින් රු.300,000/-ක් මහා සභාවේ වියදම් ලෙස 2013.02.28 දින ලබා ගෙන ඇත. එම මහා සභා රැස්වීම පවත්වා ඇත්තේ ඊට පසු දින වන 2013.03.01 දින දී බැවින් ඒ වෙනුවෙන් වියදම් කර අත්තිකාරම් මුදල කඩිනමින් පියවිය යුතුව තිබුණි. එහෙත් මෙම අත්තිකාරම මාස 2 කට පසුව පියවීමේ දී චෙක් පත ගැනීමට පෙර දිනය යටතේ රු. 224200/- ක් මුල් පිටපතක් නොවන, රූපසිංහ ඇන්ඩ් සන්ස්, මගින් විදුලි ලාම්පු මිලට ගත් සාවද්‍ය බිල්පතක් ද, (එකක් රු.1475 වටිනා විදුලි පහන් 152 ක්) මහා සභාව පැවැත්වූ දිනය යටතේ පොතක් මුද්‍රණය හා බැදීම සඳහා එක් පිටපතකට රු. 280/- වන පරිදි 28000/- ක, සීඩීඑන් එන්ටර්ප්‍රයිසස්, ව්‍යාජ බිල්පතක ද ඡායා පිටපත් අමුනා වවුචරයක් ඇත.

එසේ කලක් ගතවීත් ඉදිරිපත් කර ඇති එම වවුචරය විගණක නිරීක්ෂණය කර ඇත්තේ වවුචර අංකයක් නැති, දිනයක් නැති, පරීක්ෂා කිරීමක් නැති, අනුමත කලේ කවුරුන්ද යන්නත් නැති, බාර ගන්නාගේ නම සදහන් වුවත් බාර ගත් අයකුගේ අත්සනක් හා දිනයක් නැති, ටිපෙක්ස් කොට නැවත ලියා ඇති බිල් පත් වල විශ්වාස කළ නොහැකි ඡායා පිටපත් අමුණා ඉදිරිපත් කර ඇති බවය. 2013.04.30 දින ලක්ෂ 3 ක වටිනාකම ලැබීමක් ලෙස සටහන් කිරීම සනාථ කෙරෙන මූලාශ්‍ර ලියවිල්ල වන ලදුපතවත් ඉදිරිපත් කර නොමැති බව විගණක වාර්තා කරයි. මේ තත්වයන් මත මෙය සත්‍ය වියදමක් ලෙස මතයක් ප්‍රකාශ නොකරණ බව ද විගණක වාර්තා කර ඇත. මෙය වංචනික ක්‍රියාවකි.

මේ අක්‍රමිතාව සම්බන්ධයෙන් සාමාජිකයින් විසින් ප්‍රඥප්තියේ 47-2 යටතේ විමර්ශණයක් කරන ලෙස ඉල්ලා ඇති අතර, ඔවුන් පෙන්වා දී ඇත්තේ මහා සභාවට පැමිණි සාමාජිකයින් 68 ක් වූ බව හා විදුලි පහනක මිල රු. 975 ක් වන බවත්ය. මේ කරුණු කාරණා සියල්ලම අනුව මුදල් වංචාවක් සිදුවී ඇති බව පැහැදිලි වේ. අවාසානාවට මෙන්ම මෙම සමිතියේ වගකිවයුත්තෝ, අන් සමිතිවලට මගපෙන්වන, උපදෙස් දෙන, ගිණුම් විගණනය කරන ඇත්තන් වීම නිසා නොදන්නා කමට මෙවැනි කටයුතු සිදුවිය නොහැකිය. මෙය හිතා මතා කර ඇති මුදල් වංචාවකි.

සමුපකාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ම කාරක සභිකයින්වන මෙම සමිතියේ පසු ගිය වසර 5 ක කාලයේ මෙම සමිතියේ විගණන වාර්තාවලින් පෙන්වා දී ඇති ඌනතාවයන් අනුව මෙම නිලධාරීන්ට නිවැරදි අවබෝධයක් හා නිසි පුහුණුවක් තවමත් නැති බව තහවුරු කරයි. සිය යටත් නිලධාරීන් සාමාජිකත්වය දරණ සමිතියක් නිසා කලින් ලබා ගත් ලක්ෂ 10 ගෙවීමෙන් පසුව මේ වනවිට මෙවැනි වංචාවල් ගැන සොයා නොබලාම තවත් ලක්ෂ 100 ක් සමුපකාර අරමුදලින් ලබා ගත හැකි සමිතියක් වීම ද, එම ප්‍රමාණය සමිතියේ තැන්පත්වලින් 83% ක් වන බවත්, අතිශය සාධාරණ හේතුමතම දී ඇතිවා විය හැකිය. ව්‍යාපාරයේ උන්නතිය සඳහා සමුපකාර අරමුදල් අතිශය සාධාරණ අන්දමට යොදවන උසස් නිලධාරීන් සමුපකාර ව්‍යාපාරයේ සිටින නිසා සමුපකාර අරමුදලට වඩ වඩාත් දායක කිරීමට සියලුම සමිති උනනන්දු විය යුතු බවටත් දිරිගන්වන සුලුවේ. එම මුදලින් මේන විට ලක්ෂ 40 ක ස්ථාවර තැන්පතක් දැමීමට සමිතියට හැකි වී තිබේ. 2017.03.31 දිනට ජංගම ගිණුමේ ලක්ෂ 13 කට වැඩි මුදලක් ද රඳවා ගත හැකිව ඇත.

06 පිටුවට...

## ලෝක ළමාදින සැමරුම් උළෙලෙ



වැලිවිට අංක 01 සණස සමිතියේ පිපෙන කැකුළු ළමා සමාජයේ ලෝක ළමාදින සැමරුම් උළෙලෙද ත්‍යාග පිරිනැමු ආකාරය

සුසිල් හැරිසන් වාර්තාකරු

## සී.ස. පැපිලියාන සණස සමිතිය වෛද්‍ය සායනය



පසුගියදා දින සී.ස. පැපිලියාන සණස සමිතියේ නොමිලේ වෛද්‍ය සායනයක් පැවැත්විණි. මෙහිදී සාමාජික සාමාජිකාවන්ගේ අදි රුධිර පීඩනය(ප්‍රෂර්), සීනි පරීක්‍ෂාව, කොලොස්ට්රෝල් පරීක්‍ෂාව, හා අනෙකුත් රෝග හදුනාගෙන ඒවාට අවශ්‍ය උපදේශත්මක සේවාවද ලබාදීමට අවස්ථාව උදාවිය.

## පිටිපන නගරය සණස වාර්ෂික චාරිකාව

පිටිපන නගරය සණස සුබසාධක අංශය සංවිධානය කල මෙම වසරේ චාරිකාව පසුගියදා දින තුනකින් යුත් සාමාජික සාමාජිකාවන් රැසකගේ සහභාගිත්වයෙන් සාර්ථකව නිමවුහ. ත්‍රිකුණාමලයේ කෝනේශ්වරම් කෝවිල, නිලාවේලි, තිරියාය ගිරිහඩු සෑය, නල්ලූර් කන්දසාමි කෝවිල, මුන්තූර් පැරණි ලිද, නාගදීපය, අම්මාන් කෝවිල, අලිමංකඩ රණවිරු කුලරත්න සිහිවටනය ආදී ස්ථාන නැරඹීමට සහ වන්දනා කිරීමට මේ මගින් පිටිපන නගරය සණස සාමාජික සාමාජිකාවන්ට සහ ඔවුන්ගේ පවුල්වල අයට ඉඩකඩ සැලසින. මෙම චාරිකාව සඳහා ශ්‍රී ලංකා යුද හමුදාවේ සහ නාවික හමුදාවේ නිලධාරි මහත්වරුන් අපවෙත දන්වන ලද සහයෝගයට අපගේ ස්තුතිය පුදකරමු.



ලක්ෂ්මන් ගුණවර්ධන - පිටිපන නගරය සණස වාර්තාකරු



# විශ්වසනීය ඉතිරිකිරීමට හුරුකරමු.

තවත් වසරක් උදා වෙන්නේ නැවුම් හැඟීමෙන් නවමු අදහස් මිනිසා තුළ ඇතිකර වීමෙනි. මුදල් ගණුදෙනු කරන ආයතනයකින්, නව වසරට අළුතෙන් හිතන්නට යමක් දායාද කළ යුතුවේ. ඒ සදහා අවශ්‍ය වන්නේ විශ්වාසයයි.

මුදල් තැම්පත් කිරීමේදී පාරිභෝගිකයා හුදෙක් බලාපොරොත්තු වන කරුණු දෙකක් ඇත. පළමු වැන්න වන්නේ තමා තැන්පත් කරන මුදල් අපහසුවකින් තොරව ආපසු ගැනීමට හැකිවේය යන විශ්වාසයයි. දෙවැන්න නම් තමන්ගේ තැම්පත්වල ස්වභාවය තවත් කෙනෙකුට දැන ගැනීමට නොහැකි වේය යන විශ්වාසයයි.

මෙම විශ්වාසය පාරිභෝගික ගණුදෙනු කරුවන් වෙත ඇති කිරීමට සණස සමිති කරවන නිලධාරීන් විසින් වගබලා ගතයුතුවේ. මේ සදහා මුදල් ආරක්‍ෂාව ඇති බවටත්, සණස සමිතියේ විනිවිද භාවය ඇතිවන සේ බාහිර දැක්ම, කළමණාකරනය විසින් ඇතිකළ යුතුය.

විනිවිද භාවය නම්, සණස සමිතියේ මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබදව සාමාජිකයා දැනුවත්ව සිටීමයි. එයින් විශ්වාසය තහවුරු කරලිමට හැකිවේ. සෑම මාසයක් පාසාම සාමාජිකයාට මූල්‍ය තත්ත්වය පහදාලීමත්, ඕනෑම අවස්ථාවක තම මුදල් ආපසු ලබාගත හැකිවීමත්, විගණනයකින් තහවුරු කරන මාසික මූල්‍ය ප්‍රමිතීන් සකසා මහ සභාවට ඉදිරිපත් කිරීම තුළින් සමිතිය වෙත ඇතිවන විශ්වාසය හා අවබෝධය ඉතා වැදගත් වේ. එමෙන්ම සමිති කාර්යාල සැකැස්ම, සේප්පුවක් භාවිතා කිරීම, සාමාජිකයා ගණුදෙණුවට පැමිණි අවස්ථාවේ අවට පරිසරයේ පහසුකම්, භාවිතාකරන පොත්පත්වල ආරක්‍ෂාව හා බාහිරව පෙනෙන දොරගුලු සවිමත්වීම ඉතා අවශ්‍යවේ.

කවුන්ටරය සැකසීමේදී ගණුදෙනු සඳහා පැමිණෙන්නන්ට හුදෙක් අන්‍යයන්ගේ ගණුදෙනු දැසින් නොදකින ලෙස පොත්පත් භාවිතය හා කම්පියුටරය භාවිතයට පහසුකම් තිබිය යුතුවේ. එසේම ගණුදෙනු කරන කාර්යාලය ආරක්ෂිත බව, ප්‍රගති ප්‍රකාශන ප්‍රදර්ශනය කිරීමෙන් අවබෝධයක් ඇතිකරවීම හා පිරිසිදු බවක් දැකුම්කළු බවත් කාර්යාලය තුල මෙන්ම බාහිරවත් තිබිය යුතුවේ.

තවදුරටත් විශ්වාසය තහවුරු කරලීම සදහා කළමනාකරුවෙක් හා සහායකයෙක් හෝ සාමාජික ප්‍රසාදය ලබාගත් සභාපතිවරයෙක්, ලේකම්වරයෙක් හා භාණ්ඩාගාරික වරයෙක් සිටීම වැදගත්වේ. පාරිභෝගිකයාගේ තැම්පත් මුදලට ආකර්ෂනීය පොළියක් ලබාදීමෙන් තැම්පත් මුදල් වැඩිකර ලීමට ඉවහල් වේ. ගණුදෙනුවේදී ලදුපතක් පැහැදිලිව සටහන් සහිතව නිකුත් කිරීමද වැදගත්ය. තැම්පත් කරන මුදල් විවිධ ප්‍රබේධ යටතේ සිදු කිරීමෙන් ගණුදෙනු කරුට එම ප්‍රබේධයන්ගෙන් කැමැති අවස්ථාවක් ලබා ගැනීමට ඉඩ සළසා දිය යුතුය.

එමෙන්ම ප්‍රබෝධාත්මක ක්‍රමවේද ඇති කිරීමෙන් පොළියට අමතරව ත්‍යාග ලබාදීම තැන්පත් කරවන හැමට, තරඟ ප්‍රවේශ ඇතිකරලීම තැන්පත් කරුවන්ගේ ළමුන් සදහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම වැනි සිත් ඇදගන්නා වැඩපිළිවෙල විශ්වාසය තහවුරු කිරීම උපයෝගී වේ.

ඔබේ සමිතියට ආකර්ෂණය ඇති කරගැනීමට නව වසරේ සිතුම් හා පැතුම් සාර්ථක වේවා!! යනුවෙන් කොළඹ සණස දිසා සංගමයේ ආශිංසනයෙන් දිරිමත් වේවා!!


## ස.ණ.ස. පුවත් කොළඹින්

☆ **අධීක්ෂණය**
ඩී. වීරසූරිය
තුසිත් කුමාර වීරවර්ධන

☆ **ප්‍රකාශන කමිටුව**
කේ. ඩී. පතිරත්න
හේමසිරි බෙනරගම
සුනිල් අබේසුන්දර
එම්.රොහාන් ජේ. පෙරේරා
එම්.ඩී. ජිනදාස

☆ **විධායක සහාය**
නාලක ජයසූරිය

☆ **පරිගණක අක්ෂර හා සැලසුම**
කේ. ඒ. සම්පත් ප්‍රසංග



**කොළඹ දිස්ත්‍රික් ස.ණ.ස. සංගමය**
**220/1, හයිලෙවල් පාර, මහරගම.**
දු.ක. 0112 851213, 0112 848801, 0114 301228
gm@sanasacolombo.lk


# මූල්‍ය ආයතනයක තිබියයුතු



## යහපාලන මූලධර්ම සහ ක්‍රියාකාරකම්

ඕනෑම මූල්‍ය ආයතනයක් පාලනය කිරීම සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩලයක් විසින් සිය කළමනාකරණය හරහා නිවැරැදි මග පෙන්වීමක් කළයුතුය. එසේම මෙම දෙකොටසේම ප්‍රධාන වගකීම වන්නේ ආයතික මෙහෙවර ඉටුකිරීම සඳහා සියවත්කම් ආරක්‍ෂා කරමින් ඒවායේ ශුද්ධ වටිනාකම දිනෙන් දින දියුණුකිරීමයි. ඒ සඳහා ප්‍රධාන වශයෙන් බලපානු ලබන කාරණා 3 කි.

**1 යහපාලනය සහ එහි මූලධර්ම මත පිහිටා කටයුතු කිරීම.**
**2 අධ්‍යක්‍ෂ මණ්ඩලය හා කළමනාකරණය අතර සමතුලිතව වැඩකිරීමට ඇති හැකියාව වර්ධනය වීම.**
**3 මූලෝපායික ක්‍රමවේද තුලින් මෙහෙයුම් කාර්යක්‍ෂමතාවය වැඩිකර ඵලදායීතාවය දියුණුකිරීමයි.**

ඉහත කොටස් දෙකම සියපාලන වගකීම් ක්‍රියාත්මක කිරීමේදී විශේෂයෙන් සලකා බැලිය යුතු කරුණු කිහිපයකි. එනම්,

1 නීතිමය රාමුව සහ එය ආරක්‍ෂා කරමින් ක්‍රියාත්මක වීම.
2 තමන්ට ප්‍රාග්ධනය සපයා දෙන සාමාජිකයන්ගේ, ගණුදෙනුකරුවන්ගේ සහ කොටස්කරුවන්ගේ විශ්වාසය වැඩිදියුණු කිරිම.
3 තමන්ගේ පරිපාලනයට යටත්ව තිබෙන ස්ථාවර සහ ජංගම වත්කම් වල ගුණාත්මකභාවය සහ ඵලදායීතාවය වැඩිදියුණු කරලීම.
4 මානව සම්පත් සංවර්ධනය සහ සමාජීය සුභසාධනය ඇති කරලීම.
5 ජාතික ආර්ථකයේ කොටස්කරුවකු වීමෙන් ආදායම් බෙදීයාමේ විෂමතාවය අවම කිරීමට හවුල්වීම.

ඉහත සියළුම අරමුණු හා වගකීම් ඉෂ්ඨ කිරීමටනම්, යහපාලනයේ මූලික මූලධර්ම සහ ක්‍රමවේද අනුගමනය කළයුතුය. එකී ක්‍රමවේද සහ මූලධර්ම සිය වගකීමක්සේ ඉෂ්ඨ කරමින්, වගවීමේ, මූලධර්මයට යටත්විය යුතුය.

මෙය ඉෂ්ඨ කර්නේ කෙසේද ? මෙය ඉටුකිරීමට නම් දෛනිකව සිදු කල යුතු කාර්යයන් කිහිපයකි. එනම්,

1 විධායකය සහ කළමනාකරණය අතර ඇති සම්බන්ධතාවය, වගකීම සහ භූමිකාව ඉතා මැනවින් වටහා ගැනීම.
2 දෛනික මෙහෙයුම් කාර්යක්‍ෂමතාවය ඉතා උපරිම මට්ටමින් පවත්වා ගැනීම.
3 කණ්ඩායම් හැඟිම වර්ධනය වන අයුරින් නිතරම කටයුතු කිරීම.
4 ණය කළමනාකරණය ශක්තිමත් කිරීම තුලින් ආදායම් වැඩිකර ගැනීම.
5 ණය කල්පසුවීම අවම කිරීම තුලින් ඵලදායී වත්කම් ආරක්‍ෂාකර ගැනිම.
6 අවදානමට මුහුණදී මට අවශ්‍ය මනා අවදානම් කළමනාකරණයක් ගොඩනැංවීම.
7 තාක්‍ෂණය යොදා ගැනීම තුලින් මෙහෙයුම් කාර්යක්‍ෂමතාවය වැඩිකිරීමත්, දත්ත වල නිවැරැදි තාවය සහ යාවත්කාලීනත්වය ආරක්‍ෂාකර ගැනීම.
8 කාර්යාල කළමනාකරණය සහ ව්‍යාපාරික පසුබිම කාලයට උචිත ලෙස පවත්වා ගැනීම.
9 අරමුදල් කළමනාකරණය තුලින් මූල්‍ය ඵලදායීතාවය ඉහල නංවා සිය ගණුදෙනු කරුවන්ගේ විශ්වාසය සහ අභිමතාර්ථ ඉහල නැංවීම.
10 මානව සම්පත් ප්‍රාග්ධනය නිරන්තර වැඩිදියුණු කිරීම හා ශක්තිමත් කිරීම.
11 නිරන්තර වෙනස්වන සමාජීය අවශ්‍යතාවයන්ට ගැලපෙන ලෙස නීතිමයරාමුව තුල සිය නිෂ්පාදනය හා සේවා වල මුහුණුවර වෙනස් කිරීම.
12 සමාජීය දත්ත සහ පසුබිම පිළිබඳව මනා වැටහීමක් සහිතව තීරණ ගැනීමේ ක්‍රියාවලියක් සකස් කිරිම.
13 කාර්ය සාධන ක්‍රියාවලිය නිරන්තව අධ්‍යයනය කරමින් ඉලක්කයන්ට ලඟාවීම.

ඉහත කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා වගකීම් සපුරාලීමට අධ්‍යක්‍ෂමණ්ඩල සහ කළමනාකරණයේ පහත සඳහන් හැකියාවන් වර්ධනය වියයුතුය. එනම්,

1 කාර්යක්‍ෂමතාවය
2 කැපවීම
3 නිපුණතාවය
4 විශේෂඥ හැකියාවන්
5 යහපත් ආකල්ප සහ ගුණාංග
6 අභ්‍යන්තර ව්‍යුහය
7 විවිධ තලවල කාර්යයන් සහ පටිපාටි පැහැදිලිව අර්ථ දක්වා තිබීම

යනකරුණු වර්ධනය වීම තුලින් මූල්‍ය ආයතනයක යහපාලනය ගොඩනංවාලීමෙන් සමාජීයක වගකීම ඉෂ්ඨ කළහැකිය. මෙම කරුණු වඩා ගැඹුරින් ඉදිරි කලාප වලදී සලකා බලමු.

**තුසිත් කුමාර වීරවර්ධන**
**සාමාන්‍යාධිකාරී**
**සී.ස.කොළඹ දිස්ත්‍රික්සණසසංගමය.**

## සුභ නව වසරක්ම වේවා !

වසරින් වසර කොල ගැලවෙන දින දසුනේ
හැමදා සිහින වැළඳගෙන ඉන්නේ එක අසුනේ
ගතවූ අතීතය නොහිතමු කඳුළුත් වසුනේ
පින්තූරයක් ලෙස වේවා හද සසුනේ

**ලක්‍ෂමන් ගුණවර්ධන - පිටිපන නගරය වාර්තාකරු**



# තොරතුරු දැනගැනීමේ අයිතිය

තොරතුරු දැනගැනීමේ අයිතිය ජනතාව සතු මූලික අයිතිවාසිකමක් ලෙස සලකනු ලැබේ. තොරතුරු සන්නිවේදනය ජන ජීවිතයේ එක් අංගයකි. ගොවියා කුඹුරට බසින්නේත් ධීවරයා මුහුදු යන්නේත් කාලගුණික තොරතුරු අධ්‍යයනය කිරීමෙන් පසුවය. වන සතුන්ට පවා ජීවිත ආරක්ෂාව පිණිස තොරතුරු සන්නිවේදනය අවශ්‍ය වේ. සත්තු සුනාමි අවස්ථාවේදී පූර්ව සංඥා ඇසුරින් ගොඩබිම කරා දුවගොස් දිවි බේරා ගත්හ. මුල් වරට තොරතුරු දැනගැනීමේ පනතක් 18 වන සියවසේදී ස්වීඩනයේ සම්මත කරගන්නා ලදී. 1945 දී පිහිටුවාගත් එක්සත් ජාතීන්ගේ සංවිධානය මෙම අයිතිය පිළිගත් අතර 1948 දී ඊට අදාලව මානුෂික අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයක නිකුත් කරන ලදී. ඊට රටවල් 82 කට වැඩි සංඛ්‍යාවක් සහභාගි විය. ලොවපුරා වෙසෙන සරණාගතයන් සහ දිළිඳු ජනතාවගේ අයිතිවාසිකම් රැකදීම මෙහි මූලික පරමාර්ථය විය. එහි 19 වන වගන්තිය සිවිල් සහ දේශපාලනික අයිතිවාසිකම් රැකදීම සදහන්ය. 1966 දී මෙය වඩාත් පුළුල් ලෙස සාකච්ඡා වූ අතර අන්තර් ජාතික වශයෙන් දේශපාලනික, ආගමික, වාර්ගික, ජාතික, ගැටුම් වැලැක්වීම එහි අරමුණ විය. ලෝක තත්වය ප්‍රජාතාන්ත්‍රික ලෙස හැඩගැසුනද ශ්‍රී ලංකාවේ නීතිමය ආවරණයක් සැකසී නොතිබිණි.

මෙරට තොරතුරු සන්නිවේදනය අධ්‍යාපනය සහ බුද්ධාගම එකිනෙක මිශ්‍රව විකාශනය වූවකි. වැලිපිල්ලමේ සිට සෙල්ලිපි පුස්කොල පොත් අවසානයේ මුද්‍රණ ශිල්පය හරහා පුවත්පත් සඟරා පළවීමත් සිදුවිය. 1967 දී ලංකා ගුවන් විදුලි සේවය ඇරඹුනි. විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ සීඝ්‍ර වර්ධනයක් 1980 - 83 දී සිදුවිය. මේ සඳහා රුපියල් බිලියන 2.4ක් වැය කර තිබේ. 1978 දී ඇරඹි රූපවාහිනි සේවය තොරතුරු දැනගැනීමේ තවත් දිගුවකි. දුරකථනය සහ කම්පියුටරය අද වන විට තාක්ෂණයේ ඉහළම ස්ථානයට පත්ව ඇත. 1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් පනත පැනවීමෙන් පොදු 291 පත්‍රිකාව මගින් දේශපාලඥයන්, උසස් නිලධාරීන්, ඇතුළු නියමිත පුද්ගලයන්ගේ සිවිල් තත්ත්වය, ආදායම් හා වත්කම්, බිරිඳ දරුවන්ගේ වත්කම් සියල්ල හෙලිකළ යුතුය. හෙලි නොකිරීම, අතපසු කිරීම, තොරතුරු සැගවීම, දඩුවම් ලැබිය යුතු වරදකි. එසේම ඕනෑම පුරවැසියෙකුට නියමිත මුදලක් ගෙවා ලබාගත් එම තොරතුරු මත දේශීය ආදායම් කොමසාරිස් හෝ අල්ලස් හෝ දූෂණ කොමිෂම ඉදිරියට පමුණුවා දඩුවම් ලබාදීමට පුළුවන.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකළ 19 වැනි සංශෝධනයට අනුව "තොරතුරු දැනගැනීමේ පනත 2016 අංක 12" පාර්ලිමේන්තුවේ ඒකච්ඡන්දයෙන් සම්මත විය. දේශපාලනඥයන්, නිලධාරීන් විසින් සිදු කරණ සාවද්‍ය ක්‍රියා, රජයේ මුදල් අවභාවිතය, වංචා සහ දූෂණ හෙළිකර ගැනීමට පුළුවන. තොරතුරු ලබාගැනීම සදහා ලිඛිතව ඉල්ලුම් කළ යුතුය. එහි අඩුපාඩු කම් පෙන්වා ප්‍රතික්ෂප කළ නොහැක. දින 14, දින 21 හෝ ඉතා හදිසි කරුණකදී පැය 48ක් ඇතුලත තොරතුරු ලබාදිය යුතුය. පෞද්ගලික කරුණු, මැතිවරණ කොමසාරිස් විසින් සීමාකරන ලද කරුණු, පාර්ලිමේන්තු වරප්‍රසාද යටතට ගැනෙන සහ අධිකරණයේ විභාගවන නඩු සම්බන්ධ තොරතුරු ලබාගත නොහැක. මෑතදී මෙම පනතේ ප්‍රතිපාදන යටතේ වැදගත් කරුණු අනාවරණය කර ගැනීමට හැකිවිය.

අනෙක් සුවිශේෂී සිද්ධිය වන්නේ විශේෂයෙන් සමුපකාර ක්ෂෙත්‍රයට සම්බන්ධ "සමුපකාර අරමුදල" දේශපාලඥයන් සහ නිලධාරීන් විසින් අවභාවිතයට ලක්කර තිබීමයි. 2018 ජනවාරි සණස කොළඹින් පුවත් පතට "සමුපකාර අරමුදලට සිදුවන්නේ කුමක්ද " යනුවෙන් සමුපකාර ප්‍රසාදිනී වීරසූරිය මහතා විසින් අනගි ලිපියක් පලකර තිබුණි. එහි සමුපකාරික යන්ගේ අයිතිවාසිකම් බිද වැටීම, පොදු දේපළ යටතේ ගැනෙන මුදල් අවභාවිතය විස්තර කර තිබේ. රජයේ විගණකාධිපතිට, සමුපකාර සංවර්ධන කොමසාරිස්ට, අදාල අමාත්‍යංශ ලේකම්වරුන්ට මෙම තොරතුරු ඇසුරින් නීතිය ක්‍රියාත්මක කිරීමට හැකිවනු ඇත. වගකිවයුත්තන් නිහඬවීම යනු නීතිය වල් වැදී කැලෑ නීතිය රජවීමයි.

**යූ.ඩී.එස්. වීරසිංහ - සාමවිනිසුරු නැ. ඇරැව්වල අංක 2 සණස**

# වාර්ෂික ත්‍යාග ප්‍රදානය



කටුවාවල නීලම්මහර සණස සමිති ශාලාවේ පැවැත්වූ "පිපෙන කැකුළු" ළමා සමිතියේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය පසුගියදා උත්සවාකාරයෙන් පවත්වන ලදී. එම අවස්ථාවේ දෙමාපියන් හමුවේ අරමුණ පැහැදිලි කල ගරු සභාපති නයන ප්‍රභාත් බන්ඩාර මහතා දරුවන්ගේ සුභ සිද්ධිය පතා අවශ්‍යතාවයන් හදුනාගෙන දරුවන් ඇගයීමට ලක්කිරීම ඉතාම වැදගත් බව ප්‍රකාශ කරන ලදී. දරුවන් අරක්ෂාකාරීව රැකබලා ගැනීම දෙමාපියන් සතු වගකීමක් බවත් තව දුරටත් ප්‍රකාශ කරන ලදී.

සමිතිය විසින් සංවිධානය කරන ලද මෙම උත්සවයේ නත්තල් සීයාගේ පැමිණීම දු දරුවන්ට සතුටට කරුණක් වු අතර, ඒතුමාගේ සුරතින් ත්‍යාග හා රසකැවිලි ලබාදෙන ලදී. නත්තල් ගී ගායනා කරමින් දරුවන් සතුටු වූ අතර දු දරුවන්ගේ විශේෂාංග වාරයද පවත්වන ලදී. ඉන්පසු පැමිණි සියළුදෙනා සතුටින් විසිර ගියහ.

**ඩබ්.ඩී. ශිරානි**
**කාන්තා කමිටු සභාපතිනිය**
**කටුවාවල නීලම්මහර සණස**

# තැන්පත් හා සාමාජික වර්ධනය සදහා දොරින් දොරට පහත්ගමදී....

ඔක්තෝබර් සකසුරුවම් මාසය වෙනුවෙන් තම බල ප්‍රදේශය තුල දොරින් දොරට ගොස් තැන්පත් සහ සාමාජික වර්ධනය කිරීම සදහා කොළඹ දිස්ත්‍රික් සණස සංගමය ද සම්බන්ධ කර ගනිමින් ඔක්තෝබර් 20වෙනි දින ප්‍රවර්ධන වැඩ සටහනක් සිදු කරන ලදී.

ඊට අමතරව එම මාසය තුල එක් එක් දිනයක් සදහා ගමේ සාමාජිකයින් සියලු දෙනාම ආවරණය වන පරිදි ආරාධනා කර පහන් දල්වා එක් එක් දවසේ ගණුදෙනු ආරම්භ කිරීමද සිදු කරන ලදී.



**කේ.ඒ. පියතිලක - හංවැල්ල කලාප උප සභාපති**

# මනුසත් උරුමය

සුමුදු පුද බිම පසගලා
නැමැද වෙහෙරත් රිදී
රසදුනෙකි නෙතගෙහි,
කලාගාරය විහාරේ.
සතර පැති ලෙන් දොරෙහි
රහතුන් බවුන් වැඩුවේ
පැරණි අකුරුත් බ්‍රාහ්මී
පැවසුවේ එදා තතු
වෙළඳුන් ඇස ගැසුනු
රිදි ලෙන පිරුණු සම්පත
පුදා රන්මැලි මහා සෑයට
ගැමුණු රජු දිනා ගති
කරවිය වෙහෙර රිදී නම්කර
වැඩමවා රං පිළිම
තැන්පත් කළේ පිදුමට
මහරහත් තෙර "ඉන්ද්‍රගුප්ත' නම්,
වරකා වැළඳු නිසා නම්ගත්
විහාරය, හින්දු දෙවොලක්සේය
බුදු ගෙයක කිතුනු රූ
මල් අසුන අරාගති
සිතුවම් කිතු චරිත
ඇති එකම පුදබිමයි බොදු
ඇත්දත් කැටයමින් පිරි
උළුවස්ස සොබමත් වු
පංචනාරී ඝටය - දෙපසින්ය සිංහ රූ
ලියවැල් වටා ගිය - නාටිකාංගනාවක් මතුකොට
දෙවොල ගබඩා මැදුර - තිබු ඉගිය දෙයි සැමට
දෙළොස් රියනින් යුත් - බුදු පිළිම වහන්සේ
පසුපසින් අඹා ඇති - තොරණ මකරුන් මුහුණු දෙපසට
එකම මුහුණකි සිංහ - සිරුර තිදෙනෙකු අරා ඇති
නමින් ත්‍රී සිංහවේ - උසඹ කුංජරේ' විස්කම් රූ එමට
උරුමයකි සිරිලකෙහි

**පබැදුම - හේමසිරි බෙනරගම**

නොමිලේ දෙන දෙය අගය කරන්න

# දියගම සණස සමිතියෙන් නව වසරට පාසැල් පොත්

"පාසැල් නිවාඩුව දුන් විගස 2019 නව පාසැල් වාරයට අවශ්‍ය පාසැල් උපකරණ ලබාදීමට කටයුතු කිරීම ඉතා ප්‍රශංසනීයයි. අද සමාජයේ නොමිලයේ දෙන දෙය අගය කිරීමක් නැහැ. නොමිලේ දෙන දෙය අගය කරන්න. අගය කිරීමට කටයුතු කරන්න. අගය කිරීමට පුරුදු වෙන්න. දියගම සණස සමිතියට තව තවත් සමාජ සත්කාරක වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ශක්තිය ලැබේවා"

පසුගියදා දියගම විහාරස්ථාන ශාලාවේදී පැවති දියගම සණස සමිතියේ වාර්ෂිකවම සිදුකරනු ලබන ළමා සමිතියේ සාමාජික දරු දැරියන්ට, සමිතියේ සාමාජික සාමාජිකාවන්ගේ දරු දැරියනට සණස බැංකුවේ ගිණුම් හිමි දරු දරියන්ට 2019 නව පාසැල් වාරයට අවශ්‍ය පාසැල් අභ්‍යාස පොත් හා පාසැල් උපකරණ ලබාදීම,


2018 වසරේ පහවසර ශිෂ්‍යත්ව විභාගය සමත් සාමාජික සාමාජිකාවන්ගේ හා ළමා ගිණුම් හිමි දරුවන්ට මුදල් ත්‍යාග පිරිනැමීම හා සකසුරුවම් මාසයේදී (ඔක්තෝම්බර්) ළමා ගිණුම් හිමි දරු දැරියන් හා වැඩිහිටි සාමාජික සාමාජිකාවන්ගේ ඉතුරුම් කැට වල මුදල් ඒකරාශිකරනය කිරීම වෙනුවෙන් ත්‍යාග හා නව ඉතුරුම් කැට ලබාදීමේ උත්සවයට එක්වෙමින් කොළඹ දිස්ත්‍රික් සණස සංගමයේ හෝමාගම කලාපීය ගරු අධ්‍යක්ෂ අතුල ප්‍රසන්න ගී කියනගේ මහතා මෙසේ අදහස් දැක්විය.

මෙම උත්සව අවස්ථාවට දියගම විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය දියගම ධම්ම රක්ඛිත ස්වාමීන් වහන්සේ, කොළඹ දිස්ත්‍රික් සණස සංගමයේ දියගම පර්ෂද සම්බන්ධීකරන නිලධාරි නිර්මදා ජිනාදරී මහත්මියද එක්වුහ.

මෙදින 2019 නව පාසැල් වාරය වෙනුවෙන් දු දරුවන් 170 දෙනෙකුට පාසැල් අභ්‍යාස පෙත් හා පාසැල් උපකරණ ලබාදීමද, 2018 වසරේ පහවසර ශිෂ්‍යත්ව විභාගය සමත් ටී.පී.ජී. දුනිත් ඉනාර හා හිමේෂ් සදීප රණසිංහ යන දරුවන් දෙදෙනාට මුදල් ත්‍යාග පිරිනැමීමද, සකසුරුවම් මාසයේදී ඉතුරුම් කැටවලට වැඩිම මුදලක් ඒකරාශිකරණය කල ළමා ගිණුම් හිමි ජයග්‍රහකයින්

ප්‍රථම - හිමේෂ් සදීප රණසිංහ, දෙවන - ඉසුරු මතීෂ දිරනාත්, තෙවන - තනුරි කවිත්මා

වැඩිහිටි සමිති සාමාජිකයින්ගේ ඉතුරුම් කැටවලට වැඩිම මුදලක් ඒකරාශිකරනය කරමින් ජයග්‍රාහී ත්‍යාග හිමිකර ගන්නා



ලද්දේ,

ප්‍රථම - මල්ලිකා රාජපක්ෂ මිය, දෙවන ආර්.ඒ. තිලකා මාලනී මිය, තෙවන - විනීතා වීරසුරිය මිය

මීට අමතරව ඉතුරුම් කැටවලට මුදල් ඒකරාශිකරණය කරන ලද ළමා සාමාජිකයින් සියළු දෙනාට ත්‍යාගයක් සමග නව ඉතුරුම් කැටයක් ලබාදීමද, ඉතුරුම් කැටවලට මුදල් ඒකරාශිකරණය කරන ලද වැඩිහිටි සාමාජික සියළු දෙනාටම නව ඉතුරුම් කැටයක් ලබාදීමද සිදුකෙරින.

මෙදින ලබාදුන් නව ඉතුරුම් කැටවලට එක්රැස් කරන මුදල් 2019 වසරේ සකසුරුවම් මාසයේදී (ඔක්තෝම්බර්) දියගම සණස බැංකුව වෙත භාරගැනීමට නියමිතය.

දියගම සණස සමිතියේ ගරු සභාපති ඩී. අමරතුංග මහතාගේ හා ගරු උප සභාපති ජේමසිරි වීරසුරිය මහතාගේ උපදෙස් හා මගපෙන්වීම මත කාරක සභික මහත්ම මහත්මීන් ප්‍රමුඛ සණස බැංකු කාර්යය මණ්ඩලය විසින් මෙම උත්සවයේ වැඩකටයුතු සංවිධානය කලහ.

**චමිලා ජයතුංග**
**දියගම සණස ගරු ලේකම්**


# පිටිපන නගරයේ කාන්තාවනට පුහුණු වැඩමුළුවක්

හෝමාගම කලාපයේ සණස කලාප වැඩමුළුවක් පසුගියදා පිටිපන නගරය සුහද අන්‍යොන්‍යාධාර සමිති ශාලාවේදී පැවැත්වින. එහිදි මධ්‍යම කාන්තා කමිටු ගරු ලේකම් ප්‍රේමලතා වනිගසේකර සහ පිටිපන පර්ෂද සභාපතිනි ඉන්ද්‍රානි නාරායන මහත්මිය ඇතුළු සණස ශාඛා සමිති 7ක සාමාජිකාවන් 54ක සහභාගිත්වයෙන්, දේශීය අමුද්‍රව්‍ය වලින් අත්කම් හා සැරසිලි නිර්මාණකරනය පිළිබඳව ප්‍රායෝගික දැනුවත් කිරීමක් ලබාදෙන ලදී.



**ලක්ෂමන් ගුණවර්ධන - පිටිපන නගරය සණස වාර්තාකරු**

# දෙහිවල උද්‍යානයේදී නොමිලේ වෛද්‍ය පරීක්ෂණයක්




දෙහිවල උද්‍යාන වසමේ ජීවත්වන ප්‍රජාවේ වැඩිහිටියන් අතර හදවත් හා රුධිර වාහිනී ආශ්‍රිත රෝග අවදානම අඩුකිරීම සඳහා ජංගම දුරකථන මූලික කරගත් පෝෂණ උපදේශන හා ජීවන රටාවේ වෙනස් කිරීම් හි කාර්යසාධකතාව සදහා වයස 34-64 අතර අය සඳහා පරීක්ෂණයක් කොළඹ වෛද්‍ය විද්‍යාලයේ මහාචාර්ය උපුල් සෙනරත් මහතා ඇතුළු කාර්ය මණ්ඩලය පැමිණ පසුගියදා පැවැත්විය. සාමාජිකයින් 60 දෙනෙකු පමණ සහභාගිවූ අය අතරින් 33 දෙනෙකු තෝරා ගන්නා ලදී. උද්‍යාන සණස කාරක සභාවේ උනන්දුව මත වැඩසටහන සාර්ථක කර ගැනීමට හැකිවිය.



**ප්‍රසාද් විජේවර්ධන**
**උද්‍යාන සණස වාර්තාකරු**

# වාර්ෂික විනෝද චාරිකාව

බටුවන්දර එකමුතු සණස සමිතියේ වාර්ෂික විනෝද චාරිකාව පසුගියදා ළමා සමාජයේ ළමයින් සහ සාමාජිකයින් එක්ව බදුල්ල සහ මහියංගනය නගර තුල ඉතා සතුටින් සංචාරය කරන ලදී.

**චන්ද්‍රාවති**
**ගරු ලේකම්තුමිය**





ස.ණ.ස.
පුවත් කොළඹින්



# වැඩිහිටි දිනය සමරමින්

සී.ස. උද්‍යාන සණස සාමාජිකයින් වැඩිහිටි දිනය සමරමින් පසුගියදා දින වැඩිහිටි සත්කාරයක් පැවැත්විය. උද්‍යාන සණස තරුණ කමිටු සභාපති බර්නාඩ් ජයසිරි මහතාගේ සංකල්පයකට අනුව අනුකමිටුව එක්ව සංවිධානය කළ සත්කාරක උත්සවය සාර්ථක අන්දමින් නිමකිරීමට හැකිවිය. උද්‍යාන වසම තුල ජීවත් වන වයස අවුරුදු 65 ට වැඩි අය මෙන්ම සමිතියේ 65 ට වැඩි සාමාජික සාමාජිකාවන් මේ සඳහා සුදුසු කම් ලැබූ අතර, උදෑසන 9.30 සිට 10.30 දක්වා ධර්ම දේශනයක් පවත්වා ඉන් අනතුරුව දහවල් 12.30 වනතුරු වැඩිහිටියන් විසින් නොයෙකුත් විශේෂාංග ඉදිරිපත් කරමින් විනෝද විය. දහවල් සියළු දෙනාටම ප්‍රනීත ආහාර වේලකින් සංග්‍රහ කළේය.



ඔවුනට ත්‍යාග වශයෙන් වියළි ආහාර පාර්සලයක්ද ලබාදී වැඩ සටහන නිමාකළේය.

මෙම වටිනා සත්කාරය සිදු කිරීමට අප සමිතියේ ගරු සභාපති ඩබ්.ඒ. කුමාරසිරි මහතා ඇතුළු කාරක සභිකයන් ද සියළුම අනුකමිටු සාමාජික සාමාජිකාවන්ද, නන් අයුරින් උදව් උපකාර කළ සියළු

**ප්‍රසාද් විජේවර්ධන**
**උද්‍යාන සණස වාර්තාකරු**

# අද හොඳම දවස

මේ දවස් වල අපට ඇසෙන පනිවිඩයක් තමා පරණ බඩුගන්නවා "පරණ බඩු වලට අළුත් ඒවා දෙනවා" යන්න මේවා ඇහෙන විටම එම රථය අසලට ඔබ යන බව මා දන්නවා. සමහර විට රථය ගේ දොරකඩටම එනතෙක්ම මගබලාගෙන ඉන්නවා. විශේෂයෙන් අළුත් අවුරුද්දක් එනවිට ගෙදර තිබෙන කුණු කන්දල් නිකම්ම හරි රථයට බාරදීලා නිදහස් වෙන්නයි අපි බලන්නේ. සමහර විට ඔබට මිලක් ලැබෙන්නත් පිලිවන් රථය ගියා දැන් ඔබ නිදහස් ආපසු ඔබ නිවසේ

ඇත්තටම ඔබ නිදහස්ද? වසර පුරාම ඔබේ සිතේ රැදුන මතකයෙන් බැහැර කල යුතු සිතුවිලි රැසක්ම ඉතිරි වෙලා. සමහර විට වසර ගනනාවක සිට එකතුවුනු නරක, ගඳගහන සිතුවිලි 'බිලුමැන්ඩල්' කුණු කන්ද වගේ පිරිලා ඉතිරිලා දෝරෙ ගලාගෙන යනවා. මේ ප්‍රකාශය ඔබට පමනක් නොවේ. සෑම කෙනෙකුටම බලපාන දෙයක්. අපේ සිතුවිලි ගැන වඩාත්ම හොදින් බැලිය යුතු කාලයක් තමයි මේ. අපේ මතයට විරුද්ධ පිරිස්වලට, ගැහුවොත් ගහපන් යන සංකල්පය මත සිට අවිචාරාත්මක ලෙස කටයුතු කිරීම ජාතියක හෝ රටක විනාශය කරා යන ගමන සීග්‍රගාමී කිරීමට මංපෙත් විවර කිරීමකි. බුදුන් වහන්සේගේ ප්‍රතිපත්ති අනුව කටයුතු කරන වැඩි ජනතාවක් හැටියට "නහී වේරේන වේරානි" - වෛරයෙන් වෛරය නොසංසිදේ - යන පාඨය නිරතුරුවම සිහිපත් කල යුතුයි. අසල් වැසියාට ප්‍රේමකරන්න යන ජේසු දෙවියන්ගේ වදනත්, ශුද්ධවූ නබිනායකතුමාගේ යහපත් ජන සමාජයක් සඳහා වූ ප්‍රාර්ථනයක් අපට ඉතාමත් වටිනා අළුත් අවුරුදු පණිවිඩ බවට පත්වෙනවා. මේ සියළු දේම සමග අයහපත් සිතුවිලි ඉවතලා, යහපත් හොඳ සිතුවිලි පමනක් අපලග තබාගනිමු.

*"ඔබ සැමට*
*සුබ නව වසරක් වේවා"*

**ලක්ෂමන් ගුණවර්ධන,**
**පිටිපන නගරය වාර්තාකරු**

# ලෝක ළමා දිනය සැමරීම

ලෝක ළමා දිනය නිමිත්තෙන් උද්‍යාන සණස 'රන් කැකුළු' ළමා සමාජයේ දු දරුවන් සහ අධ්‍යාපන කමිටුවේ මුලිකත්වයෙන් බෙල්ලන්තර වාසනා ළමා නිවාසයේ ආබාධිත දැරියන් සඳහා සවස තේ පැන් සංග්‍රහයක් පිරිනැමීය. ලෝක ළමා දිනය වෙනුවෙන් වාර්ෂිකව පවත්වන වැඩ සටහන ලෙස මෙය සිදුකල අතර, රන් කැකුළු ළමා සමිතියේ දු දරුවන් සවස තේ පැන සංග්‍රහය ලබාදී ඉන් අනතුරුව එම ආබාදිත දැරියන් ඉදිරියේ එළිමහන් වේදිකාවේ නැටුමෙන් හා ගැයුමෙන් පැයක පමණ කාලයක් විශේෂාංග කිහිපයක් ඉදිරිපත් කර ඔවුන් සතුටට පත් කළේය.




**ප්‍රසාද් විජේවර්ධන - උද්‍යාන සණස වාර්තාකරු**

# වෑතර රිලාවල 37 සමරයි

වෑතර රිලාවල සමිතියේ 37 වන සංවත්සරය පසුගියදා වෑතර මහා විදුහල් ශාලාවේදී පවත්වන ලදී.

ගරු සභාපති ආර්. ෂෙල්ටන් සේනාරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද සංවත්සරික මහා සභාවේදි සාමාජිකත්වයට මෙන්ම ආරාධිත අමුත්තන්ටද විශේෂ තිළිණ ප්‍රධානය කරන ලදී.

# මාසික තිළිණය

ස.ණ.ස. කොළඹ පුවත් මාසික ප්‍රශ්ණයට කූපනය මගින් ඔබ සපයන, නිවැරදි පිළිතුරට තිළිණයක් පිරිනැමීමට කටයුතු සම්පාදනය කර ඇති බව සතුටින් දන්වමු.

ඔබ ජයග්‍රහකයෙක් නම්, ඔබේ සමිතියේ හා පෞද්ගලික අනන්‍යතාවය තහවුරු කරවා එම තිළිණය දිසා සංගමයෙන් ලබාගන්න.

**සංස්කාරක මණ්ඩලය**

# කියවන්න... දැනුම ලබන්න....

## දෝතට තෑගි ගන්න ....

ඔබ කළ යුත්තේ මෙහි පළවන ප්‍රශ්ණයට පිළිතුර කූපනයේ පුරවා තැපැල් පතක අලවා සණස පුවත් කොළඹින් අංක 220/1, හයිලෙවල් පාර, වත්තේගෙදර, මහරගම වෙත 2019 පෙබරවාරි 15 ට පෙර එවීමයි. ජයග්‍රාහකයින් රැසක් සිටියහොත් කුසපත් ඇදීමෙන් වාසනාවන්තයා තෝරා ගනු ලැබේ.

**ප්‍රශ්ණය :-** **තොරතුරු දැනගැනීමේ පනත 2016 වසරේ සම්මතවුනේ කිනම් අංකය යටතේද?**

## කුපන් තරගයේ ජයග්‍රහණය

**කූපන අංක 11**

**සී.ස. සීතාවක සණස සමිතියේ**
**ජී.ඩී. රීටා ගමගේ මිය**

## කුපන් අංකය 01

මුලකුරු සමග නම: ..........................................................

ස්ථිර ලිපිනය: ..........................................................

..........................................................

දුරකථන අංකය: ..........................................................

පුරුදු අත්සන: ..........................................................

සණස සමිතියේ නම: ..........................................................

..........................................................

පිළිතුර: ..........................................................

..........................................................




**මෙදින පත්වූ නව නිලධාරීන්**

| | | |
|---|---|---|
| **ගරු සභාපති** | : | ආර්. ෂෙල්ටන් සේනාරත්න |
| **ගරු උපසභාපති** | : | පී.ටී. දයාසේන |
| **ගරු භාණ්ඩාගාරික** | : | එම්. රොහාන් ජේ. පෙරේරා |
| **ගරු කාරක සභික** | : | ශාන්ති ජයවති, ඊ. චන්දිකා, සීතා රණතුංග, එස්. චන්ද්‍රිකා |

**වාර්තාව හා ඡායාරූප**
**එම්. රොහාන් ජේ. පෙරේරා - ප්‍රකාශන කමිටු නියෝජිත**

ස.ණ.ස.
පුවත් කොළඹින්

# වඳිමු මුණි සිරිපා



# සමිතියකට ඇති වත්කම නායකයින් දැනුවත්වීමයි.

**සණස නායක සමුපකාර ප්‍රසාදිනි ඩැනිසන් වීරසූරිය**

සමුපකාර සමිතියක් සාර්ථකව සිය සේවාවන් උපරිමයෙන් කළ හැක්කේ එහි කළමනාකරණ මණ්ඩලයවන කාරක සභිකයින්ගේ හා කාර්යමණ්ඩල තමා නිරතව සිටින සංවිධානයට අදාළ නියමයන් මැනවින් දන්නා තරමටයය. ඒ නිසා අප සැවොම සණස සමිතියක් සඳහා බලපාන නීතිරීති අතුරු ව්‍යවස්ථාව කාරක නියෝග පිළිබඳ දැනුවත් විය යුතු බවය. එවිට අපට බලපාන ගැටළුවලට සාර්ථකව මුහුණ දිය හැකි බවත් තවදුරටත් අදාළවන නීතිරීති පිලිබඳව වන දැනුවත්කම ද අතිශය වැදගත්වන බවද පෙන්වා දෙන ලදි. අතීතයේ මෙන් සමුපකාර කොමසාරිස්වරුන් ගෙන් හා ඔවුන් යටතේ සේවා සපයන නිලධාරීන්ගෙන් සංවර්ධනයට නිවැරදි මගපෙන්වීමන් නොලැබෙන බැවින් අපට ඉහළ දැනුමක් අවශ්‍යවන්නේ වර්තමනායේ ඇතිකරවන අභියෝගවලට මුහුණ දී ඉදිරියට යාම සදහා ය.

සමුපකාරය සදහා ඇති අභියෝග වලට කෙසේ මුහුණ දිය යුතුද ? යන මැයෙන් කළුතර දිස්ත්‍රික්කයේ හොරණ, ඉංගිරිය හා මදුරාවල යන කළාපවල ස.ණ.ස.සමිතිවල සමුපකාර නායකයින් වෙනුවෙන් හොරණ කුරුදුවත්ත විහාරස්ථ ශලාවේදි පසුගිය දා පවත්වන ලද පුහුණු වැඩසටහනකට සහභාගි වූ සණස ජාතික සන්ධානයේ ගරු සභාපති වීරසූරිය මහතා එසේ පැවසීය.

පවත්නා ප්‍රඥප්තිය, අතුරු ව්‍යවස්ථාව හා ඒ අනුව කාරක නියෝග සකස් කර ගන්නා ආකාරයත් හා සංශෝධන කිරිම සදහා ගතයුතු ක්‍රියා මාර්ගද ගිණුම් කටයුතු විගනනය කිරිමේදි බලපාන ගැටළුවලට මුහුණ දිය යුතු ආකාරය පිළිබදවත් සහභාගිවූවන් කළ විමසීම් සදහා ගත හැකි විසදුම් ද පැහැදිලි කරදෙන ලදි. , පවත්නා සමහර නීති, නීතියේ මූලධර්ම වලට පවා පටහැනි බවට උදාහරණ පෙන්වමින්, සද්භාවයෙන් යුතුව කිසිදු වැටුපක් දීමනාවක් නොලබා කරන මෙම සේවාවන් තමන්ගේ ආත්මලාභය සදහා නොව පරාර්ථය වෙනුවෙන් සිය කාලය, ශ්‍රමය අතහැරීමේ චේතනාව මතම කළ යුතුබවත්, එය දෙලොවටම යහපත සලසනු ඇති බවත් ඒ නිසා අත්‍යවශ්‍යවන්නේ කාරක සභිකයින්ගේ අවංකභාවයත් කැපවීමත් පමණක් බවද පෙන්වා දෙන ලදී.

කළුතර දිස්ත්‍රික් සංගමයේ ගරු සභාපතිතුමා ද මේ පිලිබදව අදහස් දක්වමින් ප්‍රකාශ කලේ සමුපකාරය පිළිබදව පුළුල් දැනුමක් ඇති වීරසූරිය මහතාගෙන් අද දින විශාල දැනුමක් අපගේ නායකයින්ට ලබා ගැනිමට හැකිවිම සමිතිවල භාග්‍යයක් කොට සලකන බවය. කලුතර සංගමයේ ගරු උප සභාපතිතුමා, කලාපීය අධ්‍යක්ෂතුමා ද සංගමයේ සාමාන්‍යාධිකාරී තුමිය ද සහභාගි වූ මෙම සම්මන්ත්‍රණය කලාපයේ අනුමැතිය ඇතිව කලාපීය ලේකම්තුමිය විසින් සංවිධානය කරනු ලැබ තිබිණි.

**සටහන - අජිත් ප්‍රේමලාල්**

උඳුවප් පොහොය දිනයෙන් ආරම්භව වෙසක් පොහොය දිනයෙන් අවසන් වන මුණි සිරිපතුල වන්දනා කිරීම, මෙවසරද බැතිසිතින් යුතුව, කරුණාකරන්නට එළඹි අසිරිමත් කාලය මෙයයි.

පසුගිය ශ්‍රී පාද වන්දනා සමය අවසන් වීමෙන් අනතුරුව සාධාතුක කරඬුව, සුමනසමන් දෙවියන්ගේ රන්මුවා පිළිමය හා දේවාභාරණ පැල්මඩුල්ල, ගල්පොත්තාවෙල චෛතිහාසික ශ්‍රී පාද රජමහ විහාරයේ පිහිටි ශ්‍රී සුමනසමන් දේවාලයේ තැම්පත් කර ඇත. මෙම සධාතුක කරඬුව සහිත දේවාභරණ රැගත් පෙරහැර උඳුවප් පොහෝ දින අලුයම යෙදුන සුබ මොහොතින් පැල්මඩුල්ල ගල්පොත්තාවෙල ශ්‍රී පාද රජමහ විහාරයෙන් පිටත්ව ශ්‍රී පාද ස්ථානය වෙත ගමන් කෙරේ. පෙරහැර තුනක් ලෙස සංවිධානය ගතව හැටන් මාර්ගයෙන්, කුරුවිට පලාබද්දල මාර්ගයෙන්, හා බලන්ගොඩ බගවන්තලාව මාර්ගයෙන් ගමන් කොට ශ්‍රී පාද ධර්ම මධ්‍යස්ථානය වෙත වැඩම කරවන සධාතුක කරඬුව සහිත දේවාභරන එතැනින් රන්සිවි ගෙයක තැම්පත් කොට පංචතූර්යය නාදය පතුරවමින් ශ්‍රී පාද උඩමුළුවට වැඩම කෙරේ.

ශ්‍රී පාද නාහිමියන්ගේ අනුශාසනා පරිදි සෙත් පිරිත් සජ්ජායනා සහිතව සුබ නැකතින් ශ්‍රී පාද පද්මය සුවඳ පැණින් දෝවනය කෙරේ. ඉන් අනතුරුව ප්‍රථම ශ්‍රී පාද පද්ම ප්‍රජාව පවත්වන ශ්‍රී සුමන සමන් දෙවියන්ගේ රන්මුවා පිළිමය හා දේවාභරණ ශ්‍රී පාද උඩමුළුවේ පිහිටි සමන් දේවාලයේ තැන්පත් කෙරේ. මෙම ක්‍රියාවලියෙන් පසු සිරිපතුල නැමදීම සදහා බැතිමතුන්ට අවස්ථාව සැලසේ.

සුමන සමන් දෙවියන්ගේ ආරාධනය පරිදි අප ගෞතම බුදුරජාණන් වහන්සේ පන්සියයක් මහ රහතන් වහන්සේලා සමග සෘද්යෙන් සමන්ත කූඨ පර්වත මස්ථකයට වැඩම කොට ඉන්ද්‍රනීල මාණික්‍ය රත්නය මත වම් සිරිපා සලකුණද, දකුණු සිරිපා ලකුණ මක්කම (කල්පිටිය) වෙරලේ තැබූ බවද ඉතිහාන කතාවල සඳහන් වේ. බුදු රජාණන් වහන්සේගේ තෙවෙනි ලංකා ගමනේදී සිදු වු මෙම අසිරිමත් සිදුවීමෙන් පසු සමන්තකූඨ පර්වතය ශ්‍රී පාද කන්ද නමින් බොදු බැතිමතුන් අතර ප්‍රචලිත විය. ඉන් රමණීය ආකර්ශනීය පරිසරයකින් යුතු මුහුදු මට්මමේ සිට අඩි හත්දහස් තුන්සිය හැටක උසින් පිහිටි සමන්ගිර මත ශ්‍රී පාදය පිහිටුවා ඇත්තේ ආශ්චර්යයක් ලෙසටය.

මෙම පසුබිම වට ගෙතුන ජනප්‍රවාද රාශියක් නිශ්ශංක මල්ල රජු සමයේ දෙපා නැත්තෙකු විසින් සුරංගනාවන්ගේ ආධාරයෙන් ශ්‍රී පාදය සොයාගත් බව එක් ජනකතාවකි. වළගම්බා රජු දවස පැමිණි සතුරු උවදුරු දරා ගැනීමට නොහැකි වුණු රජතුමා සතුරන්ගෙන් බේරීම සඳහා සමන්තකූඨ පව්ව අඩවියට පැමිණ සිටි අවස්ථාවක මුවකු පසුපස ලුහු බඳිද්දී ශ්‍රී පාදය දැකගැනීමට හැකිව ඇත. එහෙත් බොහෝ මත අතර සුප්‍රකට මතය වන්නේ, සුමනසමන් දෙවියන්ගේ ආරාධනයෙන් බුදු පියාණන් වහන්සේගේ පා සටහන් නිල් මාණික්‍යය මත පිහිටුවා ජනතාවට වන්දනාමාන කිරීමට සැලැස්වූ බවය.

සිරිපා කරුණා කිරීමේදී සිරිත් විරිත් රාශියක් ඉටුකළ යුතුව තිබේ. මකරතොරණ අබියසදී පංසිල් සමාදන්වී, සියළු බැතිමතුන් සීත ගඟුලෙන් ස්නානය කොට පිරිසිඳු වී යායුතුය. කිරිකෝඩු හා දඬුකෝඩු වශයෙන් කෝඩුකාරයින් වැන්දවීම, ඉදිකටුපාන, ගෙත්තම් පාන ආදී තැන්වලදී විශේෂිත චාරිත්‍ර රාශියක් එදා මෙදා තුර සිදුකරමින් සිරිපා වන්දනාවට සහභාගි විය යුතුය. වන්දනා නඩ අතර හින්දු බැතිමතුන්ද, කිතුණු බැතිමතුන්ද වෙති. මේ කවුරුත් ගත සිත විඩාව සංසිදවා ගැනීමට කවි සීපද ගායනා කරමින් කන්ද තරණය කිරීම, සමගියේ ලක්ෂණයකි. හැම පිරිසකගේම නඩයක් සඳහා ගුරෙකු ඇත. ඔහු හෝ ඇය නඩේගුරා නමින් හඳුන්වයි. සුමනසමන් දෙවි පිහිටෙන් සිරිපා වන්දනා කරන බැතිමතුන්ට තෙරුවන්ගේ පිහිට හා ආශිර්වාදය ලැබ සැදැහැ සිත් ඇතිව තම ජීවිතයේ සැහැල්ලුව ලබා මනස සන්තර්පනය කර ගැනීමට ඉවහල් වේ.

ශ්‍රී පාද පද්මය හා පිහිටා ඇති මංගල ලකුණු ගණන 216කි. වම් ශ්‍රී පාදයේ 108ක් සහ දකුණු ශ්‍රී පාදයේ 108ක් උත්තම මංගල ලකුණු පිහිටා ඇත. පුරාණ තුන්සරණ ග්‍රන්ථයේ පහත සදහන් කවියෙන් පැහැදිලි වන්නේ සිරිපතුල පුරා පැතුරුණු මංගල ලකුණු ගැනයි.

දෙසියක් සොළසකි සිරිපා ලකුණෝ
රසයක් වෙන ඇසුවොත් ගුණ වරුණෝ
වසයක් පද පව් සතහට අගුණෝ
දසයක් ගුණවද බණ තුන් සරණෝ

**සැකසුම - හේමසිරි බෙනරගම**
(පොත්පත් ඇසුරෙන් සකස් කර ඇත)

# කුඩුවෙන් නික්ම ගිය කිරිල්ලිය

කුඩුව තුල සිටියේ පුංචි කිරිල්ලියකි ඒ නිසා කුඩුවෙන් එපිට මානය නොදන්නා ලොවකි. කුඩුවේ කවුළුවෙන් මෙපිට බලා සිටින්නේ කවදා තටු ගසමින් ඉගිලී යම්ද කියාය.

දවස උදාවිය.
එහි උණුසුම් පහස විදමින් සිටි
නිසි කල පැමිණ පසු කූඩුවෙන් මිදී
එලිමහනේ රිසි ලෙස පියාඹන්නට විය

දිනෙක කුරුල්ලකු හමුවිය
නිදහසේ ඔබ මොබ සැරිසරමින්
දිනෙක ඔවුන්ටම වෙන් වු කුඩුවක් තනනු ඇත
කාලයේ වැලිතලාවට හසුව දරුමල්ලන්ද
සමග ජීවත් වීමට පුරුදු වනු ඇත.

**සන්ධ්‍යා ජයකොඩි - පිටිපන නගරය සණස**

# ප්‍රබෝධන වැඩසටහන

සැමට එළිය සදන - ගමට පහන සණස යන තේමාව පෙරදැරි කර ගනිමින් ප්‍රාථමික සණස සමිති කිහිපයක දොරින් දොරට ගොස් සාමාජිකත්වය වර්ධනය කිරීමේ වැඩසටහන් මාලාවක් අති සාර්ථක ලෙස නිමාවට පත්විය. කොළඹ දිස්ත්‍රික් සණස සංගමයේ කාර්ය මණ්ඩලයේ හා සමිති වල කාරක සභාව හා සාමාජිකයින් වැඩසටහන සදහා දායකත්වය ලබාදෙන ලදී. සාමාජිකත්වය දුර්වල මට්ටමක පවතින සමිතිවල සාමාජිකත්වය වර්ධනය කර තැන්පත් ක්‍රම හා ණය ක්‍රම පිළිබදව දැනුවත්

**වාර්තාකරු - කමල් සිසිර කුමාර**



## 01 පිටුවෙන්.... විධායක බලය සීමාකර පාර්ලිමේන්තු බලය වැඩිකිරීම.

- ✤ අමාත්‍ය මන්ඩලයේ අමාත්‍යවරයෙක්, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයෙක් හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙක්, අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත ජනාධිපතිවරයාගේ අත්සන යටතේ යවනු ලබන ලිපියක් මගින්, ඉවත් කරනු ලැබුව හොත්, හෝ ස්වකීය අත්සන යටතේ ජනාධිපතිවරයා වෙත යොමු කරනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වුවහොත්, හෝ තවදුරටත් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු නොවුවහොත් හෝ, මිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ යම් තාක් කල් අමාත්‍ය මණ්ඩලය පවතින්නේ ද ඒතාක් කල් ස්වකීය ධුරය දරනු ඇත. 46-3 (පෙරපරිදි තම මතයට ඉවත් කළ නොහැකිවීම)
- ✤ පාර්ලිමේන්තුවේ වැඩිම ආසන සංඛ්‍යාව ලබාගන්නා පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම සහ පාර්ලිමේන්තුවේ අනෙකුත් පිළිගත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් එකතුව පිහිටුවනු ලබන ආණ්ඩුවක් ජාතික ආණ්ඩුවක් බව (46-5) ජාතික ආණ්ඩුවක් පිහිටුවන අවස්ථාවේ දී අමාත්‍ය මන්ඩලයේ අමාත්‍යවරයන් සංඛ්‍යාව ද අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් සංඛ්‍යාව ද නියේජ්‍ය අමාත්‍යවරයන් සංඛ්‍යාව ද පාර්ලිමේන්තුව විසින් තීරණය කළ යුතු බව (46-4)
- ✤ 2015 අප්‍රේල් 22 වන දිනට පෙර පිලිවෙලින් ජනපති සහ අගමැති ධුරය දරන තැනැත්තන් එම දිනෙන් පසු, මෙම පනත මගින් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්වන බව (48-1-ආ)
- ✤ මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් මත, නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීම සදහා උචිත වාතාවරණ නිර්මාණය කිරීම තහවුරු කිරීම (33-1-ඈ)
- ✤ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ද මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් තත් කාලයේ බලපවත්නා නීතිය ඇතුලුව යම් ලිඛිත නීතියක් යටතේ ද ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය යථා පරිදි ක්‍රියාත්මක කිරීම සහ යථා පරිදි ඉටුකිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිව යුතුවීම (33-අ)
- ✤ ජනාධිපතිවරයා විසින් ඔහුගේ නිල තත්වයෙහි ලා කරන ලද හෝ නොකර හරින ලද කිසිවක් සම්බන්ධයෙන් නීතිපතිවරයාට විරුද්ධව 126 වන ව්‍යවස්ථාව (මානව හිමිකම් කඩකිරීම) යටතේ ඉල්ලීමක් කිරීමට යම් තැනැත්තකුට ඇති අයිතිය සීමා නොකිරීමත් සිදුකිරීම (35-1)
- ✤ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වඩාත් ස්වාධීනවන අන්දමට පිහිටුවීම (7-අ) පරිච්ඡේදය 41 (1) සිට 41 (ඒ) දක්වා ව්‍යවස්ථා ඇත. පහත සදහන් කොමිෂන් සභා හා නිලතලවලට පත්කිරීම් මෙම සභාවේ අනුමැතියෙන් කිරීම ස්වාධීනත්වය රැකීමේ අරමුණ මෙහි ඇත්තේය.

(අ) මැතිවරණ කොමිෂන් සභාව
(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව
(ඇ) ජාතික පොලිස් කොමිෂන් සභාව
(ඈ) විගණන සේවා කොමිෂන් සභාව
(ඉ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
(ඊ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව
(උ) මුදල් කොමිෂන් සභාව
(ඌ) සීමා නිර්ණය කොමිෂන් සභාව
(එ) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව

# සකසුරුවමට හුරු කිරීම

*සකසුරුවම් මාසයේ ඉතිරි කරමු සුමිතුරේ*





සකසුරුවම් මාසය නිමිති කර ගනිමින් ඔක්තෝම්බර් මාසය පුරාවට ප්‍රධාන කර්යාලයේ හා සියලුම කලාප කාර්යාල වල අප සාමාජික සණස සමිති හා සාමාජික නොවන ගනුදෙනුකරුවන් හට ආරාධනා කරමින් මංගල පහන්සිළුව දල්වා දවසේ ප්‍රථම ගණුදෙනුව සිදුකිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

## 01 පිටුවෙන්....

## උන්දුරුගොඩ කාන්තා සුහද හමුව

කාන්තා කමිටු සභාපතිනි ටී.ඩී. ප්‍රේමකාන්ති මහත්මිය ඇතුළු කමිටු සාමාජිකත්වයේ සහභාගීත්වය දැරූ මෙම සුහද හමුව සදහා උන්දුරුගොඩ සමිතියේ ගරු සභාපති කේ.කේ. වීරක්කොඩි, සියඹලාගොඩ සමිතියේ ගරු සභාපතිනි ගුණසිලි මාලනි පිරිස් මහත්මිය, වෙනිවැල්කොල සණස ගරු සභාපති කේ.ටී. අජිත් මහතා, අම්බලන්ගොඩ සණස සමිතියේ නිලධාරින් ඇතුලු විශාල සමුපකාරිකයින් පිරිසක් මේ සදහා සහභාගි විය. විනෝදාත්මක සතුට පිරුණු මෙම ප්‍රසංගය සැමගේ සතුටට පත්විය.

**වාර්තව හා ඡායාරූප - එම්. රොහන් ජේ. පෙරේරා**

## ජාතක කතා පොතෙන්
# කක්කට ජාතකය

හිමාලයෙහි වන අරනේ අති සොබමන් විලක් — වෙතේ
"කුලීරදහ" නව පසිඳුව එවිල වටා සතුන් — වෙතේ
ඇත් කුලයෙහි සියළු සතුන් එහි යන්නට බියක් — ඇතේ
විල වාසෙහි රං කකුළුව ඇතුන් මරා මස් — බුදිතේ

අප බෝසත් ඇත් කුලයෙහි නායක වී මෙම — පෙදෙසේ
සවිබලයෙන් හැදී වැඩී රැළ වෙනුවෙන් එහි — ගැවසේ
හස්තිනියත් මවත් සමග නායක අබියස — රිසිසේ
අවසරයක් ඉල්ලන්නේ කකුළු මරා දමන — ලෙසේ

පියා වරම් නොදී ඇතත් ඇත් රංචුව පෙරට — ගෙනේ
උපදෙස් දී පෙර ගමනට බෝසත් ඇතු පසුව — පෙනේ
පුරුදු ලෙසින් රං කකුළුද අඩු දිග හැර අමුණ — ගෙනේ
අවසන් ඇතු තමා වෙතට ඇද ගන්නේ මරණ — දැනේ

බෝසත් ඇතු හඬ දෙන්නේ බේරී යන්නට — සිතලා
ඇතුන් දුවයි පණ බේරා ගන්නට සිත් එක් — කරලා
හස්තිනියත් සැරසෙන්නේ ඇතු හැරදා තනි — කරලා
යන්නට නම් නැහැ දෙන්නේ මිහිරි හඩින් ගී — ගයලා

කංකළු නදයෙහි බැඳුනේ කකුළු හදේ — කම්පිතවී
එයින් අඬුව ලිහිල් වුනේ හස්තියාද — ඉක්මන්වී
කකුළු පිටේ තමා අඩිය බිඳ අඬු දෙක — දෙපසට වී
ප්‍රමෝදයෙන් හඬ දෙන්නේ සියළු ඇතුන් එහි — එක්වී

රං අඬුවක් පාව ගියේ "දශභාගී" — රජදහනට
'අණක' බෙරය නමින් නිමැවී රජ මැදුරේ — බබලන්නට
'ආලම්බර' බෙරය හදයි අනෙක් අඩුව — අසුරයන්ට
එහි හිමිකම අත්වන්නේ අවසනේ දී — සක්‍රයන්ට

*උපදේශය: තම අදහස් සඵල කර ගැනීමට උපාය ශක්තිය අවශ්‍ය වේ.*

*-සිරි-*

# සුභ උපන්දිනයක් වේවා !!

**කරගම්පිටිය සමිතියේ පසුගිය මස උපන් දිනය සැමරූ අය**


එල්. ප්‍රනාන්දු


පි. රාජපක්ෂ


බී.එච්. ආරියවති


එච්. සිල්වා


එල්. ප්‍රනාන්දු


ප්‍රමිතා සාගරි


එම්. වික්ටෝරියා


ජී. අයිරාංගනි


ඊ.ඒ. ඩොලිනෝනා


ආර්. වෙත්තසිංහ


ඒ. පෙරේරා


සී. කුමාරි


එච්. කුසුමාවති


දිල්හානි චමිලා


ඒ. කුමුදුනි


ජේ. ජැන්සන්


ජේ. එලිසබෙත්



එල්. මල්ලිකාආරච්චි


දිමුතු චාමර


එන්. මෙන්ඩිස්


ජේ. ප්‍රනාන්දු


ඒ. සුවාරිස්


උෂාන් තිළිණ


එම්. උදයාංගනි


කෝසල පසිදු

# සීමාසහිත මකුළුදූව නාම්පමුණුව - පලිගෙදර- ගොරකපිටිය සණස සමිතිය


වර්ෂ 1982 බැංකු කාර්යාල ගොඩනැගිල්ල


වත්මන් "සණස" අරුණළු කේන්ද්‍ර ගොඩනැගිල්ල


වත්මන් නිලධාරී මණ්ඩලය


බැංකු කාර්ය මණ්ඩලය


67 වන සංවත්සර මහා සභාවේ අවස්ථාවක්


ජ්‍යේෂ්ඨ සාමාජික ඇගැයීම් අවස්ථාවක්
(සමුපකාර ප්‍රසාදිනී ඩැනිසන් වීරසූරිය මැතිතුමාගේ සුරතින් පිරිනමන අවස්ථාව)


ළමා සමිති සාමාජික දැරියන්ගේ රංගන අවස්ථාව

